# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2248/33 - 2021 ඔක්තෝබර් මස 06 වැනි බදාදා - 2021.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 66උ වගන්තිය සමග කියවිය යුතු 66ඇ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

බස්නාහිර පළාතේ, පළාත් පාලන කොමසාරිස් ඇල්වල දේවගේ ප්‍රභාත් ඉන්දික ප්‍රසන්න වන මම, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 උ වගන්තිය සමග කියවිය යුතු 66 ඇ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාත තුළ පිහිටියා වූ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවෙහි පුරප්පාඩු වී ඇති සභාපති ධූරය සඳහා අළුත් සභාපතිවරයෙකු තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා වන රැස්වීම 2021ක් වූ ඔක්තෝබර් මස 22 දින පෙ.ව. 9.30ට කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය ලිපිනයෙහි පිහිටි කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව යන ස්ථානයේදී කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.


**ඒ. ඩී. පී. අයි. ප්‍රසන්න,**
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.


2021 ඔක්තෝබර් මස 06 වැනි දින,
බත්තරමුල්ල,
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතෙහි පිහිටි,
බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 256


1A - PG 5567 — 25 (2021/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*